මගේ අංකය: PSC/ADM/AR/07/06
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
177, නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 05

2017 අගෝස්තු මස 10 දින.

මහ ලේකම්,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

මහත්මයාණෙනි,

**2016 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා**
**කාල පරිච්ඡේදය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව 2016 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව මේ සමඟ ඔබ වෙත එවමි.

මෙයට - විශ්වාසී,



එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දැක්ම

ජාතියේ විශිෂ්ටත්වය සඳහා කැපවූ රාජ්‍ය සේවයක්.

## මෙහෙවර

සාධාරණව, විනිවිද බවින් හා සමානුකූලව මහජනයාට සේවය කිරීමට, කාර්යක්ෂම, විනයගරුක සහ තෘප්තියට පත් රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**2016.01.01 – 2016.12.31 කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්**

**සභාපති**

ඩී. දිසානායක මහතා

**සාමාජිකයින්**

විනිසුරු ඒ.ඩබ්ලිව්.ඒ. සලාම් මහතා ( 2016.01.01 – 2016.12.05 )

ඩී.එස්. විජයතිලක මහත්මිය

ආචාර්ය පී. රාමනුජම් මහතා

වී. ජෙගරාසසිංගම් මහත්මිය

එස්.එන්. සෙනෙවිරත්න මහතා

එස්. රනුග්ගේ මහතා

ඩී.එල්. මෙන්ඩිස් මහතා

එස්.ඒ.සී.එස්.ඩබ්ලිව්. ජයතිලක මහතා

## පටුන


| අනු අංකය | | කාරණය | පිටුව |
|---|---|---|---|
| 1 | හැඳින්වීම | | 01 |
| 2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග | | 01 |
| 3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල | | 03 |
| | 3.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභා බලය අභිනියෝජනය කිරීමෙන් පසු අංශ වෙත පැවරී ඇති කාර්යයන් | 05 |
| | 3.2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා | 09 |
| 4 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | | 09 |
| | 4.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමේදී මුහුණ දෙන අභියෝග හා ගැටලුවලට ලබා දී ඇති විසඳුම් | 12 |
| 5 | සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ විස්තර | | 13 |
| | 5.1 | ආයතන අංශය | 13 |
| | 5.1.1 | ආයතන අංශයෙහි කාර්ය භාරය | 14 |
| | 5.1.2 | ආයතන අංශයේ ප්‍රගතිය (2016.01.01 –2016.12.31) | 14 |
| | 5.2 | පත්කිරීම් අංශය | 18 |
| | 5.2.1 | පත්කිරීම් අංශයෙහි කාර්යභාරය | 18 |
| | 5.2.2 | පත්කිරීම් අංශයේ ප්‍රගතිය (2016.01.01 –2016.12.31) | 19 |
| | 5.3 | උසස්කිරීම් අංශය | 26 |
| | 5.3.1 | උසස්කිරීම් අංශයෙහි කාර්යභාරය | 27 |
| | 5.3.2 | උසස්කිරීම් අංශයේ ප්‍රගතිය (2016.01.01 –2016.12.31) | 27 |
| | 5.4 | විනය අංශය | 29 |
| | 5.4.1 | විනය අංශයෙහි කාර්යභාරය | 30 |
| | 5.4.2 | විනය අංශයේ ප්‍රගතිය (2016.01.01 –2016.12.31) | 32 |
| | 5.5 | අභියාචනා අංශය | 34 |
| | 5.5.1 | අභියාචනා අංශයේ කාර්යභාරය | 34 |
| | 5.5.2 | අභියාචනා අංශයේ ප්‍රගතිය (2016.01.01 –2016.12.31) | 36 |
| | 5.6 | අධ්‍යාපන සේවා කමිටුව | 36 |
| | 5.6.1 | අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යභාරය | 36 |
| | 5.6.2 | අධ්‍යාපන සේවා කමිටුවේ ප්‍රගතිය (2016.10.01 – 2016.12.31) | 37 |
| | 5.7 | සෞඛ්‍ය සේවා කමිටුව | 38 |
| | 5.7.1 | සෞඛ්‍ය සේවා කමිටුවේ කාර්යභාරය | 38 |
| | 5.7.2 | සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය (2016.10.01 – 2016.12.31) | 38 |
| | 5.8 | පාලන අංශය | 39 |
| | 5.9 | මූල්‍ය අංශය | 39 |
| | 5.10 | අභ්‍යන්තර විගණන අංශය | 40 |
| 6 | මුදල් ප්‍රතිපාදනය | | 40 |
| 7 | කාර්ය මණ්ඩලය | | 41 |
| | 7.1 | සංවිධාන සටහන | 41 |
| | 7.2 | කාර්ය මණ්ඩල සංයුතිය | 41 |
| | 7.3 | කාර්ය මණ්ඩල පුහුණු කටයුතු | 41 |
| 8 | 2016 වර්ෂය තුළ එක්එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන | | 42 |
| 9 | කොමිෂන් සභා රැස්වීම් | | 42 |
| 10 | අමාත්‍යාංශමය හා දෙපාර්තමේන්තුමය රැස්වීම් | | 42 |
| 11 | ස්තූතිය | | 46 |
| | ඇමුණුම් | | 48-50 |

## 01. හැඳින්වීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු 2015.10.15 දින නව කොමිෂන් සභාව පත් කරන ලදී. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2016 ජනවාරි 01 වන දින සිට 2016 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ මෙම වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) අනු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

## 02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග

ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව පැවති සමයේ දී, වර්ෂ 1946 මැයි මස 15 දිනැති ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාව මගින් ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි. එමගින්, රාජ්‍ය නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීම් පිළිබඳ විධායක බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දෙන ලදි.

වර්ෂ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ, එතෙක් වසර විසි හයක් පුරා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි වූ අතර රාජ්‍ය සේවය පිළිබඳ අධිකාරී බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිණ.

වර්ෂ 1978 දී දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර, එම කොමිෂන් සභාව අභියාචනා බලධාරියා වශයෙන් පමණක් කටයුතු කරන ලදි. 1992 වර්ෂයේදී රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන්ගේ (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සිට ඉහළ තනතුරු හැර) පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම පිළිබඳ විධායක බලතල අමාත්‍ය මණ්ඩලය විසින් පවරන ලද අභිනියෝජිත බලය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදි. කොමිෂන් සභාව හෝ එමගින් බලය අභිනියෝජිත කමිටුවක් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ඉඩ සැලසෙන බලතල අමාත්‍ය මණ්ඩලය වෙත රඳවා ගනු ලැබිණ.

වර්ෂ 2001 දී, 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රාජ්‍ය සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති IX වන පරිච්ඡේදය පරිච්ජින්න කොට නව පරිච්ඡේදයක් ඇතුළත් කරන ලදි. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත විය. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ආණ්ඩුක්රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබුණි. මෙම සංශෝධනය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තත්වය ප්‍රබල වෙනසකට භාජනය වූ අතර, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, රාජ්‍ය සේවයේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථානමාරු කිරීම හා විනය පාලනය කිරීම පිලිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබුණු බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. තවද මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත් කෙරිණි.

වර්ෂ 2010දී , 18වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්ථාපනය හා කර්තව්‍යයන්ට අදාළ කරුණු සංශෝධනය කරනු ලැබ ඇත. මෙය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතු කොමිෂන් සභාවකි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. ඔවුහු තෙවසරක කාල පරිච්ඡේදයක් සඳහා ස්වකීය ධූර හොබවන අතර, තවදුරටත් එවැනි එක් කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සන් වනු ඇත.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 55(1) අනු ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, පොලිස් නිලධාරීන් ද ඇතුළු ව රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන

සාමාජිකයන් නව දෙනෙකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති අය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂම හා විගණන කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟ පොලිස් නිලධාරීන් හා විගණන නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයෙන් ඉවත් කෙරිණි.

19 වන ආණ්ඩුක්‍රම වියවස්ථාවේ 57 (1) වගන්තියෙහි විධිවිධාන පරිදි අධ්‍යාපන සේවා කමිටුව හා සෞඛ්‍ය සේවා කමිටුව පිහිටුවා ඇත.

### 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පැවරී ඇති බලතල අනුව යුධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත්කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරයකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත්කරන ලද පොලිස් නිළධරයෙකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛන ගත නිලධරයෙකු හෝ විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධරයෙකු හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවලින් පත්කරන ලද පළාත් රාජ්‍ය සේවකයින්, ජනාධිපතිවරයා විසින් පත්කරන ලද අමාත්‍යාංශ ලේකම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ආයතන සේවකයන්ද හැර පළාත් සභාවල සේවය කරන දීප ව්‍යාප්ත සේවා වලට ගැනෙන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ,

- පත්කිරීම
- උසස් කිරීම
- ස්ථාන මාරු කිරීම
- විනය පාලනය හා සේවයෙන් පහ කිරීම , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

අංක 1955/22 හා 2016.02.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනය මගින් සිදුකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006හි අර්ථ නිරූපනය කර ඇති (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා

අධිකරණ නිලධාරීන් හැර) තෘතීක මට්ටමේ අධිශ්‍රේණියේ හා විශේෂ ශ්‍රේණියේ නිලධරයන් හැර අනිකුත් සියලුම නිලධාරීන්ද ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ සියලුම නිලධාරීන් ද සම්බන්ධ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාළ බලය අමාත්‍යාංශ ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පවරා ඇත. රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් සම්බන්ධව විනය පාලනය දෙපාර්තමේන්තු ප්‍රධානින්ට හෝ අමාත්‍යාංශ ලේකම්වරුන්ට පවරා ඇත.

අංක 1992/07 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1989/29 හා 2016.10.19 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් බලතල පවරා ඇති අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ පත්කිරීම් , සේවය ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවය අවසන් කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැන්වීම් හා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදීම සම්බන්ධ කටයුතු මෙන්ම සේවය හැරයාමේ නිවේදනයන්ට එරෙහිව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධව සලකා බැලීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීමේත්, ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් වලට අදාළ ක්‍රියාමාර්ග ගැනිමේත් බලතල අධ්‍යාපන සේවා කමිටුව වෙත පවරා ඇත.

අංක 1994/24 හා 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් බලතල පවරා ඇති සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ පත්කිරීම් , සේවය ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවය අවසන් කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැන්වීම් හා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදීම සම්බන්ධ කටයුතු මෙන්ම සේවය හැරයාමේ නිවේදනයන්ට එරෙහිව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධව සලකා බැලීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීමේත්, ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් වලට අදාළ ක්‍රියාමාර්ග ගැනිමේත් බලතල සෞඛ්‍ය සේවා කමිටුව වෙත පවරා ඇත.

එසේ වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද යම් බලතල පැවරීමකට අයත් විෂය පථය සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදු කරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයකදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුවේ.

### 3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභා බලය අභිනියෝජනය කිරීමෙන් පසු අංශ වෙත පැවරී ඇති කාර්යයන්

ඉහත අංක 03 ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම අනුව කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධරයන්ගේ කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ එක් එක් අංශ මගින් සිදු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

රාජ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවන්ද, බඳවාගැනීමේ පටිපාටිද සකස් කිරීම ආයතන අංශය මගින් සිදු කරයි. එම සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ පටිපාටි සකස් කිරීමේදී, සේවයට නිලධරයන් බඳවාගැනීමේ දි අනුගමනය කළ යුතු බඳවාගැනීමේ ක්‍රමය, බඳවා ගැනීමේ සුදුසුකම්, වැටුප් පරිමාණය, සේවා කොන්දේසි, උසස් කිරීමේ ක්‍රමවේද සහ අදාළ සේවයේ තනතුරු වලට පත් කිරීමේ ක්‍රමවේදය හා අනෙකුත් සියලු විස්තර ඇතුළත් කිරීම සිදුකරයි. අදාළ සේවා ව්‍යවස්ථාව හෝ බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීමට ප්‍රථම තනතුරු අනුමත කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියද, වැටුප් පරිමාණය සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද, සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශයද ලබා ගනී.

මීට අමතරව ආයතන ශාඛාව මගින් පහත සදහන් කාර්යයන්ද ඉටු කරනු ලබයි.

- රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් බලතල පැවරීමට අදාළ කටයුතු.
- රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීමේ කටයුතු
- සියලුම සේවාවන් සඳහා ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම
- අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවක්, බඳවාගැනීමේ පටිපාටියක් හෝ ස්ථානමාරු පටිපාටියක් සංශෝධනය කිරීමට අවශ්‍ය වුවහොත් අදාළ ලේකම්වරයාගේ නිර්දේශ මත එම ව්‍යවස්ථාව හෝ පටිපාටිය සංශෝධනය කිරීමට කටයුතු කිරීම.
- බලය අභිනියෝජිත බලධරයන් විසින් කරනු ලබන පත්කිරීම්, උසස් කිරීම් වලට අදාළව පැන නගින ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ලබාදීමට කටයුතු කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීමේ පටිපාටි, ස්ථාන මාරු පටිපාටි, චක්‍රලේඛ සහ නියෝග වලින් බැහැරව කටයුතු කිරීමට සිදුවන අවස්ථා වලදී ඒ සම්බන්ධයෙන් පැන නගින ගැටලුවලට විසඳුම් ලබාදීමට කටයුතු කිරීම සිදුකරයි.

ඉහත අංක 03 හි සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් නිලධරයන් සම්බන්ධයෙන් වන පත්කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් පත්කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

- අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනිම් පටිපාටි අනුව බඳවා ගැනීම
- සේවයේ ස්ථිර කිරිම ,
- සේවය අවසන් කිරීම ,
- කලින් දැරූ තනතුරට පෙරළා යැවීම ,
- වැඩ බැලීමේ / රාජකාරි ඉටු කිරීමේ පදනම මත තනතුරු වලට පත් කිරීම ,
- මුදාහැරීම ( ස්ථිර / තාවකාලික) ,
- කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම ,
- සේවයෙන් ඉල්ලා අස්වීම ,
- සේවයට / තනතුරට නැවත පත්කිරීම ,
- විශ්‍රාම ගැන්වීම ( රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පිත, අනිවාර්ය, වෛද්‍ය හේතූන් මත ),
- විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම
- පත්කිරීම් අංශයේ කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙන තිරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාගයට ගන්නා අවස්ථාවේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම අධිකාරය ඉදිරියේ පෙනී සිටීම
- ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධීකරණය වෙත යථෝක්ත තීරණවලට අදාළව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ / නිර්දේශ ඉදිරිපත් කිරීම
- මහජන පෙත්සම් කාරකසභාව විසින් විභාගයට ගනු ලබන අංශයට අදාළ පෙත්සම් සම්බන්ධයෙන් එම කාරකසභාව ඉදිරියේ පෙනී සිටීම
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත හා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන අංශයට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් නිරීක්ෂණ / නිර්දේශ ඉදිරිපත් කිරීම

ඉහත අංක 03 හි සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් නිලධරයන් සම්බන්ධයෙන් වන උසස්කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් උසස්කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

- අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනිම් පටිපාටි/ උසස්කිරීම් පටිපාටි අනුව උසස්කිරීම (ශ්‍රේණියෙන් ශ්‍රේණියට/ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත)
- සේවා ව්‍යවස්ථාවන් හා බදවා ගැනීම් පටිපාටි වල සදහන් උප ලේඛන ගත තනතුරුවලට පත්කිරීම
- මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා ඒවා විභාගයට ගනු ලබන අවස්ථාවන්හීදී එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටීම
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලබන තීරණවලට එරෙහිව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සහ එම අභියාචනා විභාගයට ගනු ලබන අවස්ථාවන්හීදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම අධිකාරියේ පෙනී සිටීම
- එමෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ වලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කෙරෙන අයදුම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

ඉහත අංක 03 හි සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් නිලධරයන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII හි II උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් හැර අනිකුත් සියලුම විනය කටයුතු වලට අදාළ පහත සඳහන් කටයුතු විනය අංශය මගින් ඉටු කරයි.

- අධිකාරී බලය පැවරුණ නිලධාරියෙකු හෝ කමිටුවක් විසින් සිදු කරන ලද මූලික විමර්ෂණයක වාර්තාවක් අමාත්‍යාංශ ලේකම්වරුන් වෙතින් ඔවුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ සමග ලැබීමෙන් අනතුරුව චෝදනාපත්‍ර නිකුත් කිරීම හෝ විනය ක්‍රියාමාර්ග අවසන් කිරීම
- නිකුත් කරනු ලබන චෝදනා පත්‍ර සඳහා පිළිතුරු ලබා ගෙන දඬුවම් පැමිණවීම, විධිමත් විනය පරීක්ෂණයකට යොමු වීම හෝ විනය ක්‍රියාමාර්ග අවසන් කිරීම
- විධිමත් විනය පරීක්ෂණයේ වාර්තාව ලද පසු දඬුවම් පැනවීම හෝ චෝදනා වලින් නිදහස් කිරීම
- නිලධාරීන්ගේ රාජකාරි වැඩ තහනම් කිරීම, අනිවාර්ය නිවාඩු ගැන්වීම හා එම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම
- නොනිම් විනය කරුණු පවතින නිලධාරීන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත්කොට විශ්‍රාම ගැන්වීම
- සේවය හැරයාමේ නිවේදන වලට එරෙහි නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අභියාචනා සලකා බැලීම

- උපරිමාධිකරණය, පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය, මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම හා කැඳවීම් කරන අවස්ථාවලදී එම ආයතනයන්හී පෙනී සිටීම

අංක 1955/22 හා 2016.02.25 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් බලය අභිනියෝජනය කර ඇති අභිනියෝජිත බලධරයකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

ඉහත ආකාරයට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධව පහත කටයුතු අභියාචනා අංශය විසින් සිදු කරනු ලබයි.

- එක් එක් අභියාචනය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා කැඳවීම.

- ඉන් පසුව එක් එක් අභියාචනය සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

- අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණ අභියාචක වෙත හා අනිකුත් අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීම.

- අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණවලට එරෙහිව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා නිරීක්ෂණ වාර්තා සකස් කිරීම සහ එම අභියාචනා විභාගයට ගන්නා අවස්ථාවේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම අධිකාරය ඉදිරියේ පෙනී සිටීම.

- මහජන පෙත්සම් කාරක සභාව විසින් විභාගයට ගනු ලබන පෙත්සම් සම්බන්ධයෙන් එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටීම.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තිරණවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ ඉදිරිපත් කිරීම.

### 3.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා

පහත සඳහන් අවස්ථාවන්හි දී හැරුණ විට කොමිෂන් සභාවේ තීරණ කිසිදු අධිකරණයකදී හෝ විනිශ්චය සභාවකදී මත විමසුමකට ලක්කළ නොහැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 අ ව්‍යවස්ථාව අනුව 126 ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන,(4) වන හා (5) වන ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව, මූලික අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කිරීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59(1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2002 අංක 4 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතින් ස්ථාපනය කරන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනය කිරීම.

### 04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමේදී එක් එක් සේවාවන් සඳහා සුවිශේෂී වූ දැනුම, කුසලතාවය, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයන් අදාළ සේවා ව්‍යවස්ථාවන් හා බඳවා ගැනීම් පටිපාටි වලට අනුගතව විනිවිදභාවයෙන් යුක්තව බඳවා ගැනීමට කටයුතු කර ඇත. නිසි කළට විධිමත්ව බදවා ගැනීම් සිදු කිරීම මගින් රාජ්‍ය සේවයේ වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන දැනුම හා කුසලතාවය හෙබි තරුණ පිරිසක් විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමට හැකියාව ලැබුණි.

ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කර පවත්වාගෙන යාමෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් පිරිනමන ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා ඇති බැවින් තවදුරටත් තත්ත්ව කළමනාකරණ පද්ධතිය තුළ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් නිරන්තරයෙන් සිදු කිරීමටත්, හඳුන්වා දී ඇති කාල නිර්ණායක හා වැඩ අදියර අනුව සාධාරණ කාල රාමු තුළ වඩාත් ක්‍රමවත්ව නිරවද්‍යව හා කඩිනම්ව කාර්යයන් නිම කිරීමටත් හැකියාව ලැබී ඇත. සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීමෙන් හා කාර්යයන් සඳහා නිශ්චිත ඉලක්ක ලබා දීමෙන් කාර්යක්ෂමතාව තවදුරටත් වර්ධනය කර ඇත.

පෙර වර්ෂ වලදී මෙන්ම මෙම වර්ෂයේද අමාත්‍යාංශ ලේකම්වරු හා පාලන කටයුතු භාර අතිරේක ලේකම්වරු කැඳවා පෙර වර්ෂයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග රාජකාරි

කිරීමේදී මුහුණ දීමට සිදු වූ ගැටලු පිළිබඳ සමාලෝචනයක් කර කාර්යයන් කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.
නිශ්චිත කාල රාමුවක් තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග ලබා ගැනිමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට නිලධාරින්ට ඉලක්ක ලබා දෙමින් ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට හැකි විය

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් තොරතුරු ගෙන්වා ගැනීමේදී ඇතිවන ප්‍රමාදයන් අවම කර ගනිමින් සේවා අපේක්ෂිත රාජ්‍ය නිලධාරින්ට කඩිනම් සේවයක් සැලසීම සඳහා විධිමත්ව සිහිකැඳවීම් කරමින් හා ලිපි හුවමාරු අවම වන පරිදි සාකච්ඡා පැවැත්වීමෙන් කටයුතු කාර්යක්ෂමව කිරීමට පියවර ගන්නා ලදී.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි වලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත පරිදි නොපැවැත්වීම නිසා අගතියට පත්වන නිලධාරින්ට සහන සැලසීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටිය විධිමත් කර ඊට අනුමැතිය ලබා දිය හැකි බලතල විමධ්‍යගත කිරීමෙන් අප්‍රමාදව කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා ගැනිමේ අවස්ථාව උදා විය.

පත්කිරීම් හා උසස් කිරීම් වලට අදාළ සියලු ලියවිලි සම්පූර්ණ කර එකවර ඉදිරිපත් නොකිරීම නිසා ඇති වන ප්‍රමාදයන් වලක්වා ගැනීමට නිකුත් කළ උපදෙස් චක්‍රලේඛය තුළින් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇතුළත් කර ඇති ආකෘති පත්‍ර පිරික්සුම් ලැයිස්තු පිළිබඳ නැවත දැනුවත් කිරීම් තුළින්ද කටයුතු තව දුරටත් කාර්යක්ෂම විය.

රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ සේවාවන් වල උසස් කිරීම් සිදු කිරීමේදී එක් එක් සේවාවන් සඳහා සුවිශේෂී වූ දැනුම් කුසලතාවය වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයන් අදාළ උසස් කිරීමේ පටිපාටි වලට අනුගතව විනිවිදභාවයෙන් යුක්තව උසස් කිරීමට කටයුතු කර ඇත. අප්‍රමාදව උසස් කිරීම් සිදුකිරීම මගින් රාජ්‍ය නිලධාරීන් තුළ අභිප්‍රේරණය ඇති කිරීමෙන් ගුණාත්මක හා සඵලදායී රාජ්‍ය සේවයක් පවත්වා ගැනීමට ක්‍රියා කර ඇත.

අතිරේක ලේකම්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රධාන ගණකාධිකාරී වැනි හා ඒ සමාන වෙනත් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන පත්කිරීම් හෝ එම තනතුරු වලින් නිලධාරින් ඉවත් කිරීම සිදු කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීමේදී ඇති වන ගැටලු සහ අහිතකර තත්ත්වයන් වළක්වා ලීම සඳහා එවැනි පත් කිරීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමෙන් අදාළ පත්කිරීම් විධිමත්ව කළ හැකි විය.

බලය අභිනියෝජිත බලධරයෙකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධරයෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් පවත්නා නීතිමය ප්‍රතිපාදන තුළ සාධාරණ හා අපක්ෂපාතී තීරණ ලබා දීම මගින් රාජ්‍ය නිලධරයන්ට සාධාරණ අභියාචන අවස්ථා සුරක්ෂිත කිරීම සිදු කරන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය මණ්ඩලය තුළ විවිධ ජාතීන්ට හා විවිධ ආගම් වලට අයත් නිලධාරීන් සේවයේ නියුතුව සිටින බැවින් ජාතීන් අතර සමගිය හා ආගමික සංහිඳියාව ඇතිවන අයුරින් සිංහල හා දෙමළ අළුත් අවුරුදු උත්සවයද, වෙසක් උත්සවය සඳහා ධර්ම දේශනාවක්ද, රාමලාන් උත්සවය සඳහා ඉස්ලාම් ආගමික මව්ලවිතුමකුගේ ප්‍රධානත්වයෙන් දේශනයක් ද දීපාවලී උත්සවය සඳහා හින්දු පූජකවරයෙකුගේ ප්‍රධානත්වයෙන් දේව පූජාවක් ද නත්තල් උත්සවය සඳහා කතෝලික පූජකවරයෙකු ගේ සහභාගීත්වයෙන් දේශනයක් ද පවත්වන ලදී. කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන්ගේ සුභසාධනය සඳහා වාර්ෂික විනෝද චාරිකාව, හා නිලධාරීන්ගේ කලා හැකියාවන් ඔප් නැංවීමේ අරමුණින් පවත්වනු ලබන “ ගී ගොනුව ” ප්‍රසංගය වැනි වැඩසටහන්ද මෙම වර්ෂය තුළදීත් ඉතා සාර්ථකව පැවැත්වීමට හැකියාව ලැබුණි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අයත් බත්තරමුල්ලෙහි පිහිටි නව කාර්යාලයීය ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු 2014 ජනවාරි මස 02 දින ආරම්භ කර ඇත. එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වසර තුනක (03) ගිවිසුම් කාලයෙන් පසු 2017.06.22 දින වැඩ අවසන් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත භාරදීමට නියමිතය. මෙම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදල රු. 432,335,423/- ක් වන අතර 2016.12.31 දින වන විට රු 289,024,687.93 ක් ගෙවීම් කර ඇත. නමුත් අදාළ ඉදිකිරීම් කටයුතු මෙතෙක් නිම නොවීම සහ බිල්පත් නියමිත පරිදි ගෙවීමට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ඉතිරිව ඇත.

සාක් සාමාජික රටවල රාජ්‍ය/සිවිල් සේවා කොමිෂන් සභා ප්‍රධානීන්ගේ රැස්වීම් මාලාවේ 5 වන රැස්වීම 2016 මාර්තු මස 28 සිට 2016.03.30 දක්වා කාලය තුළ භූතානයේ තිම්පු නුවරදී සියළුම සාර්ක් සාමාජික රටවල සහභාගීත්වයෙන් පවත්වන ලදී. එහිදී ශ්‍රී ලංකා රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝජනය කරමින් එහි සභාපති ඩී දිසානායක මහතා සහ ලේකම් එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න මහතා සහභාගී විය.

**4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටලුවලට ලබා දී ඇති විසඳුම්**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සැකසීම, පත් කිරීම්, උසස් කිරීම්, විනය හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විවිධාකාර රාජකාරිමය ගැටලු පැන නැගීම නිසා ඇති වන ප්‍රමාදයන් වැළැක්වීමට අදාළ ආයතන වල නිලධාරීන් සමග අවශ්‍ය අවස්ථාවන්හිදී රැස්වීම් පවත්වා විසඳුම් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඊට අමතරව කඩිනම් පිළිතුරු ගෙන්වා ගැනීම සඳහා අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වලට සිහි කැඳවීම් යැවීමටද කටයුතු කර ඇත.

බඳවා ගැනීම් පටිපාටි, සේවා ව්‍යවස්ථා සහ ඒවායේ සංශෝධන අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේදී එවනු ලබන දෘඪ පිටපත් වල තවදුරටත් සංශෝධනය කිරීම් අවශ්‍ය වූ විට නැවත සම්පූර්ණ බඳවා ගැනීම් පටිපාටි හෝ / හා සේවා ව්‍යවස්ථාව යතුරු ලියනය කිරීමට සිදුවන බැවින් අදාළ දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ වෙතින් මෘදු පිටපත් ගෙන්වා ගැනීම මගින් වඩා කාර්යක්ෂමව එම ලේඛන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට හැකි වූ අතර අනුමත සංශෝධන ඇතුළත් කර විද්‍යුත් තැපෑල මගින්ම එම සංශෝධිත මෘදු පිටපත අදාළ දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව තුළ දීර්ඝ කාලයක් සේවය කළ අත්දැකීම් බහුල නිලධාරීන් ස්ථාන මාරු වීම නිසාත්, පැමිණි නවක නිලධාරීන්ට අත්දැකීම් ලබා ගැනීමට කාලයක් ගතවන නිසාත් ඔවුන් පුහුණු වීම් සඳහා සම්බන්ධ කිරීමෙන් හා පසු විපරම් කටයුතු විධිමත් කිරීමෙන් අවශ්‍ය සේවාව කාර්යක්ෂමව ලබා ගත හැකි විය.

විනය කටයුතු සම්බන්ධ නිලධාරීන් සතු දැනුම අවම වීම විනය ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වා ගැනිමට ගැටලුවක්ව පැවතුණි. ඊට විසඳුමක් වශයෙන් විනය වැඩමුළු පැවැත්වීමට කටයුතු කරන ලදී. විනය කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමේ අදිටනින් මෙම වර්ෂයේදී විනය මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 05. සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ විස්තර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් අංශයන් ස්ථාපිත කොට අවශ්‍ය දායකත්වය ලබා ගෙන ඇත.

- ආයතන අංශය
- පත්කිරීම් අංශය
- උසස්කිරීම් අංශය
- විනය අංශය
- අභියාචනා අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අධ්‍යාපන සේවා කමිටුව
- සෞඛ්‍ය සේවා කමිටුව
- අභ්‍යන්තර විගණන අංශය

### 5.1 ආයතන අංශය

අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනය මගින් සිදු කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවාවකටම සේවා ව්‍යවස්ථාවක්ද, එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නා වූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක්ද සකස් කිරීම ආයතන අංශය මගින් සිදු කරයි.

එම සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීමේදී, අනුමත සෑම තනතුරකටම නිලධාරීන් බඳවා ගැනීමේදී අනුගමනය කළ යුතු බඳවා ගැනීමේ ක්‍රමය, බඳවා ගැනීමේ සුදුසුකම්, තනතුරට අදාළ වැටුප් පරිමාණය, සේවා නියමයන් හා කොන්දේසි, උසස් කිරීමේ ක්‍රමවේද සහ අදාළ අනෙකුත් සියලු විස්තර ඇතුළත් කිරීම සිදු කරයි. අදාළ සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීමට ප්‍රථම තනතුරු අනුමත කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියද, වැටුප් පරිමාණය සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයද, සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල් ගේ නිර්දේශයද ලබා ගනී.

### 5.1.1 ආයතන අංශයෙහි කාර්යභාරය


- රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් වගකීම් සහ බලතල පැවරීමට අදාළ කටයුතු.
- රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවකටම සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීමේ කටයුතු.
- එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නා වූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමේ කටයුතු.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සම්පාදනය, සංශෝධනය හා ප්‍රසිද්ධ කිරීමේ කටයුතු
- රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීම, සංශෝධනය කිරීම හා ප්‍රසිද්ධ කිරීමේ කටයුතු
- සියලුම සේවාවන් සඳහා ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම සහ සංශෝධනය කිරීම
- අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවක්, බඳවා ගැනීමේ පටිපාටියක් හෝ ස්ථාන මාරු පටිපාටියක් සංශෝධනය කිරීමට අවශ්‍ය වුවහොත් අදාළ ලේකම්වරයාගේ නිර්දේශය මත එම ව්‍යවස්ථාව හෝ පටිපාටිය සංශෝධනය කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම
- බලය අභිනියෝජිත බලධරයන් විසින් කරනු ලබන පත්කිරීම්, උසස් කිරීම් වලට අදාළව පැන නගින ගැටලු වලට විසඳුම් ලබා ගැනිම සඳහා එවනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ලබා දීමට කටයුතු කිරීම
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීමේ පටිපාටි, ස්ථාන මාරු පටිපාටි, චක්‍රලේඛ සහ නියෝග වලින් බැහැරව කටයුතු කිරීමට සිදුවන අවස්ථා වලදී ඒ සම්බන්ධයෙන් පැන නගින ගැටලු වලට විසඳුම් ලබා දීමට කටයුතු කිරීම
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, නියෝග සහ උපදෙස් නිකුත් කිරීම.

### 5.1.2 ආයතන අංශයේ ප්‍රගතිය (2016.01.01 –2016.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නව බඳවාගැනීමේ පටිපාටි | 79 |
| 2 | නව සේවා ව්‍යවස්ථා | 02 |
| 3 | බඳවාගැනීමේ පටිපාටි සංශෝධන | 61 |
| 4 | සේවා ව්‍යවස්ථා සංශෝධන | 38 |
| 5 | ස්ථානමාරු පටිපාටි | 11 |
| 6 | ස්ථානමාරු පටිපාටි සංශෝධන | 10 |
| 7 | බඳවාගැනීමේ පටිපාටි සහ සේවා ව්‍යවස්ථාවල නිවැරදි කිරීම් | 11 |
| 8 | චක්‍රලේඛ | 4 |
| 9 | විශේෂ අවස්ථාවන්හිදි බඳවාගැනීමේ පටිපාටිවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 20 |
| 10 | විශේෂ අවස්ථාවන්හිදි සේවා ව්‍යවස්ථාවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 12 |
| 11 | විශේෂ අවස්ථාවන්හිදි ස්ථානමාරු පටිපාටිවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 3 |

| | | |
|---|---|---|
| 12 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අදාළ කරුණු | 1 |
| 13 | ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 147 |
| 14 | පොදු කරුණු | 102 |
| 15 | ශ්‍රේෂ්ඨාධිකරණය, පරි.අභි.විනි.අධිකාරිය, අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු | 90 |
| | එකතුව | 591 |

**වගුව අංක 01**




**රූපසටහන අංක 01**

## 2016.01.01 සිට 2016.12.31 දක්වා අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටි පිළිබඳ විස්තර

| අනු අංකය | අමාත්‍යාංශය | අනුමත කරන ලද බ.ගැ.ප. |
|---|---|---|
| 1 | මුදල් | 06 |
| 2 | මහනගර හා බස්නාහිර සංවර්ධන | 04 |
| 3 | ග්‍රාමීය ආර්ථිකය | 02 |
| 4 | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය | 09 |
| 5 | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන | 01 |
| 6 | ස්වදේශ කටයුතු | 02 |
| 7 | නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 01 |
| 8 | කර්මාන්ත හා වාණිජ කටයුතු | 01 |
| 9 | නිවාස හා ඉදිකිරීම් | 01 |
| 10 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති | 01 |
| 11 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | 01 |
| 12 | විදේශ කටයුතු | 01 |
| 13 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු | 04 |
| 14 | ජාතික සංවාද | 01 |
| 15 | මහවැලි සංවර්ධන හා පරිසර | 05 |
| 16 | කාන්තා හා ළමා කටයුතු | 03 |
| 17 | අධිකරණ | 07 |
| 18 | අධ්‍යාපන | 03 |
| 19 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු | 01 |
| 20 | සමාජ සවිබල ගැන්වීම් හා සුභ සාධන | 01 |
| 21 | ඉඩම් | 03 |
| 22 | ක්‍රීඩා | 01 |
| 23 | කෘෂිකර්ම | 02 |
| 24 | ප්‍රවාහන හා ගුවන් සේවා | 04 |
| 25 | ප්‍රාථමික කර්මාන්ත | 01 |
| 26 | තිරසාර සංවර්ධන හා වනජීවී | 03 |
| 27 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 01 |
| 28 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 01 |
| 29 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 02 |
| 30 | අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශණ කාර්යාලය | 04 |
| 31 | මුදල් කොමිෂන් සභාව | 01 |
| 32 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 01 |
| | එකතුව | 79 |

**වගුව අංක 02**

**2016 වර්ෂයේ අනුමත කරන ලද සේවා ව්‍යවස්ථා - (02)**

1. රජයේ පුස්ථකාලයාධිපති සේවා ව්‍යවස්ථාව
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව

**2016 වර්ෂයට අදාළව නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - (04)**

| | | |
|---|---|---|
| 1. | 01/2016 | බඳවා ගැනීමේ පටිපාටි සහ සේවා ව්‍යවස්ථා සකස් කිරීම සම්බන්ධ උපදෙස් මාලාවේ 7.2.5 වගන්තිය සංශෝධනය කිරීම |
| 2. | 02/2016 | පත්කිරීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම |
| 3. | 03/2016 | කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම |
| 4. | 01/2016 (1) | බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සකස් කිරීම සම්බන්ධ උපදෙස් මාලාවේ 7.2.5 වගන්තිය සංශෝධනය කිරීම |

**2016 වර්ෂයේ සකස් කරන ලද ස්ථානමාරු පටිපාටි - (11)**

1. සුරාබදු දෙපාර්තමේන්තුවේ RS - 1 සේවා ගණය සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටිය
2. සුරාබදු දෙපාර්තමේන්තුවේ RS - 2 සේවා ගණය සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටිය
3. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයට අයත් නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
4. ඒකාබද්ධ සේවා වල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
5. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
6. සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය / කණිෂ්ඨ) තනතුරු සඳහා වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
7. සෞඛ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 2 සේවා ගණයේ නිවාඩු භාරකාරිනී / භාරකරු, ආහාර නිරීක්ෂිකා, වාට්ටු ලිපිකාරිනී, පශු එන්නත්කරු, වෛද්‍ය සැපයීම් සහකාර සහ සත්තව ඒකක පාලක ( වැටලීම්) සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
8. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වාර්ෂික ස්ථාන මාරු
9. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුගත තනතුරු වල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
10. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සහන සොයුරී වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය
11. ප්‍රාදේශීය ලේකම්වරු සඳහා වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

**5.2 පත්කිරීම් අංශය**

අංක 1955/22 හා 2016.02.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්තා වූද, 1989/29 හා 2016.01.29, 1990/24 හා 2016.10.27, 1992/7 හා 2016.11.07 යන අති විශේෂ ගැසට් පත්‍රයන්හී පළකරනු ලැබ ඇත්තා වූද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන පත්කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් පත්කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

**5.2.1 පත්කිරීම් අංශයෙහි කාර්යභාරය**


අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනිම් පටිපාටි/උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම,සේවයේ ස්ථිර කිරිම,සේවය අවසන් කිරීම,කලින් දැරූ තනතුරට පෙරළා යැවීම,වැඩ බැලීමේ/රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කිරීම, මුදාහැරීම (ස්ථිර/තාවකාලික),කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම,සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයට/තනතුරට නැවත පත්කිරීම,විශ්‍රාම ගැන්වීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පික, අනිවාර්ය, වෛද්‍ය හේතූන් මත), විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම,සේවා ව්‍යවස්ථාවන්හි උප ලේඛනගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී) පත්කිරීම.

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් ද කටයුතු කරනු ලැබේ.

### 5.2.2. පත්කිරීම් අංශයේ ප්‍රගතිය (2016.01.01 – 2016.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | විශ්‍රාම ගැන්වීම් | 764 |
| 2 | ස්ථිර කිරීම් | 2147 |
| 3 | බඳවා ගැනීම් | 2098 |
| 4 | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම් | 789 |
| 5 | කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් | 20 |
| 6 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 1181 |
| 7 | වැඩ බැලීමට / රාජකාරි ඉටුකිරීමට පත්කිරීම් | 990 |
| 8 | මුද්‍රාහැරීම් | 125 |
| 9 | ඉල්ලා අස්වීම් | 22 |
| 10 | අන්තර්ග්‍රහණය කිරීම් | 89 |
| | එකතුව | **8225** |

**වගුව අංක 03**




**රූපසටහන අංක 02**

| අනු අංකය | විශ්‍රාම ගැන්වීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 117 |
| 2 | අධිකරණ අමාත්‍යාංශය | 03 |
| 3 | අභ්‍යන්තර කටයුතු , වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 4 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 02 |
| 5 | ආරක්ෂක අමාත්‍යාංශය | 01 |
| 6 | ඉඩම් අමාත්‍යාංශය | 35 |
| 7 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 07 |
| 8 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 02 |
| 9 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 41 |
| 10 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 11 |
| 11 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 09 |
| 12 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 12 |
| 13 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 01 |
| 14 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 01 |
| 15 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 28 |
| 16 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 08 |
| 17 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 18 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 03 |
| 19 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 01 |
| 20 | මුදල් අමාත්‍යාංශය | 65 |
| 21 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 175 |
| 22 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 02 |
| 23 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 08 |
| 24 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 04 |
| 25 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 22 |
| 26 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 203 |
| | එකතුව | **764** |

**වගුව අංක 04**

| අනු අංකය | ස්ථිර කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 02 |
| 2 | අධිකරණ අමාත්‍යාංශය | 44 |
| 3 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 04 |
| 4 | ඉඩම් අමාත්‍යාංශය | 01 |
| 5 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 02 |
| 6 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 07 |
| 7 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 01 |
| 8 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 15 |
| 9 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 10 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 58 |
| 11 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 08 |
| 12 | මුදල් අමාත්‍යාංශය | 472 |
| 13 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 03 |
| 14 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 04 |
| 15 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 111 |
| 16 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 92 |
| 17 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 47 |
| 18 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 05 |
| 19 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | 52 |
| 20 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 31 |
| 21 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 192 |
| 22 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 25 |
| 23 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 11 |
| 24 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 959 |
| | එකතුව | **2147** |

**වගුව අංක 05**

| අනු අංකය | බඳවා ගැනීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 01 |
| 2 | අධිකරණ අමාත්‍යාංශය | 23 |
| 3 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව | 15 |
| 4 | ආරක්ෂක අමාත්‍යාංශය | 01 |
| 5 | ඉඩම් අමාත්‍යාංශය | 11 |
| 6 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 21 |
| 7 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 02 |
| 8 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 05 |
| 9 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 14 |
| 10 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 02 |
| 11 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 01 |
| 12 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 04 |
| 13 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 11 |
| 14 | මුදල් අමාත්‍යාංශය | 29 |
| 15 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 23 |
| 16 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 02 |
| 17 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 64 |
| 18 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 19 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 110 |
| 20 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 222 |
| 21 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 144 |
| 22 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 34 |
| 23 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 30 |
| 24 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 142 |
| 25 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 1185 |
| 26 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 01 |
|  | එකතුව | **2098** |

**වගුව අංක 06**

| අනු අංකය | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 01 |
| 2 | අධ්‍යාපන අමාත්‍යාංශය | 42 |
| 3 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව | 01 |
| 4 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 5 | ඉඩම් අමාත්‍යාංශය | 36 |
| 6 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 04 |
| 7 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 09 |
| 8 | ක්‍රීඩා අමාත්‍යාංශය | 01 |
| 9 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 06 |
| 10 | තැපැල් , තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 15 |
| 11 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 01 |
| 12 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 02 |
| 13 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 02 |
| 14 | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 26 |
| 15 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 351 |
| 16 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 18 |
| 17 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 01 |
| 18 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 78 |
| 19 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 20 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 04 |
| 21 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 03 |
| 22 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 20 |
| 23 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 166 |
| | **එකතුව** | **789** |

**වගුව අංක 07**

| අනු අංකය | කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 2 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 03 |
| 3 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 06 |
| 4 | මුදල් අමාත්‍යාංශය | 02 |
| 5 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 6 | වරාය හා නාවුක කටයුතු අමාත්‍යාංශය | 06 |
| | **එකතුව** | **20** |

**වගුව අංක 08**

| අනු අංකය | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යාපන අමාත්‍යාංශය | 152 |
| 02 | අධිකරණ අමාත්‍යාංශය | 35 |
| 03 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 04 |
| 04 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 10 |
| 05 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 06 |
| 06 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 02 |
| 07 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 02 |
| 08 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 21 |
| 09 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 03 |
| 10 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 12 |
| 11 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 11 |
| 12 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 49 |
| 13 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 18 |
| 14 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 02 |
| 15 | මුදල් අමාත්‍යාංශය | 15 |
| 16 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 527 |
| 17 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 01 |
| 18 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 10 |
| 19 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 20 |
| 20 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 02 |
| 21 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 11 |
| 22 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 02 |
| 23 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 58 |
| 24 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 39 |
| 25 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 08 |
| 26 | ශ්‍රී ලංකා සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය සේවය | 03 |
| 27 | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | 04 |
| 28 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 154 |
| | **එකතුව** | 1181 |

**වගුව අංක 09**

| අනු අංකය | වැඩ බැලීමට / රාජකාරි ඉටුකිරීමට පත්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 01 |
| 02 | අතිරේක ලේකම් | 09 |
| 03 | අධ්‍යාපන අමාත්‍යාංශය | 13 |
| 04 | අධිකරණ අමාත්‍යාංශය | 01 |
| 05 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 04 |
| 06 | ආරක්ෂක අමාත්‍යාංශය | 06 |
| 07 | ඉඩම් අමාත්‍යාංශය | 08 |
| 08 | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | 01 |
| 09 | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන | 01 |

| | | |
|---|---|---|
| | අමාත්‍යාංශය | |
| 10 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 17 |
| 11 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 12 |
| 12 | ක්‍රීඩා අමාත්‍යාංශය | 06 |
| 13 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 79 |
| 14 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 14 |
| 15 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 25 |
| 16 | තැපැල්,තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 15 |
| 17 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 07 |
| 18 | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | 01 |
| 19 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 26 |
| 20 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 06 |
| 21 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 03 |
| 22 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 23 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 07 |
| 24 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 11 |
| 25 | බුද්ධ ශාසන අමාත්‍යාංශය | 02 |
| 26 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 02 |
| 27 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 02 |
| 28 | මුදල් අමාත්‍යාංශය | 53 |
| 29 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 469 |
| 30 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 10 |
| 31 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 32 | විද්‍යා , තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 01 |
| 33 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 145 |
| 34 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 31 |
| | **එකතුව** | **990** |

**වගුව අංක 10**

| අනු අංකය | මුදා හැරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යාපන අමාත්‍යාංශය | 43 |
| 02 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව | 01 |
| 03 | ඉඩම් අමාත්‍යාංශය | 03 |
| 04 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 01 |
| 05 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 01 |
| 06 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 01 |
| 07 | මුදල් අමාත්‍යාංශය | 03 |
| 08 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 38 |
| 09 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 01 |
| 10 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 03 |
| 11 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 30 |
| | **එකතුව** | **125** |

**වගුව අංක 11**

| අනු අංකය | ඉල්ලා අස්වීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 01 |
| 02 | ඉඩම් අමාත්‍යාංශය | 03 |
| 03 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 03 |
| 04 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 01 |
| 05 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 03 |
| 06 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| 07 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 10 |
| | **එකතුව** | **22** |

**වගුව අංක 12**

| අනු අංකය | අන්තර්ග්‍රහණය කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 18 |
| 02 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 01 |
| 03 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 02 |
| 04 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 01 |
| 05 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 05 |
| 06 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | 37 |
| 07 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 06 |
| 08 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 18 |
| 09 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 01 |
| | **එකතුව** | **89** |

**වගුව අංක 13**

### 5.3 උසස් කිරීම් අංශය

අංක 1955/22 හා 2016.02.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්තාවූද, 1989/29 හා 2016.01.29, 1990/24 හා 2016.10.27, 1992/07 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන්හි පළ කරනු ලැබ ඇත්තා වූද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන උසස් කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් උසස් කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

### 5.3.1 උසස්කිරීම් අංශයෙහි කාර්යභාරය


අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනීම් පටිපාටි/උසස්කිරීම් පටිපාටි අනුව උසස්කිරීම (ශ්‍රේණියෙන් ශ්‍රේණියට/ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත), තනතුරුවලට පත්කිරීම (ජ්‍යෙෂ්ඨතාවය මත/ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව)

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් ද කටයුතු කරනු ලැබේ.

### 5.3.2 2016 වසරේ උසස් කිරීම් අංශයේ ප්‍රගතිය (2016.01.01 - 2016.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | 4180 |
| 2 | තෝරාගැනීම් මත උසස් කිරීම් | 500 |
| 3 | තනතුරුවලට පත්කිරීම් | 412 |
| | **එකතුව** | **5092** |

**වගුව අංක14**




**රූපසටහන අංක 03**

| අනු අංකය | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 02 |
| 2 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 10 |
| 3 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 36 |
| 4 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 01 |
| 5 | මුදල් අමාත්‍යාංශය | 199 |
| 6 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 13 |
| 7 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 01 |
| 8 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 08 |
| 9 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 45 |
| 10 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 140 |
| 11 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 42 |
| 12 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 61 |
| 13 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | 133 |
| 14 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 403 |
| 15 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 213 |
| 16 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 149 |
| 17 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 04 |
| 18 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 20 |
| 19 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 07 |
| 20 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 2693 |
| | එකතුව | 4180 |

**වගුව අංක15**

| අනු අංකය | **තෝරා ගැනීම් මත උසස් කිරීම්** | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 04 |
| 2 | ඉඩම් අමාත්‍යාංශය | 06 |
| 3 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 21 |
| 4 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 10 |
| 5 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 13 |
| 6 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 12 |
| 7 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 06 |
| 8 | මුදල් අමාත්‍යාංශය | 21 |
| 9 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 326 |
| 10 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 10 |
| 11 | සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 71 |
| | **එකතුව** | **500** |

**වගුව අංක16**

| අනු අංකය | තනතුරුවලට පත්කිරීම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 05 |
| 02 | අතිරේක නීති කෙටුම්පත් සම්පාදක | 01 |
| 03 | අතිරේක පාලක ජනරාල් | 01 |
| 04 | අතිරේක රේගු අධ්‍යක්ෂ | 03 |
| 05 | අතිරේක ලේකම් | 56 |
| 06 | අතිරේක විගණකාධිපති | 08 |
| 07 | අතිරේක සොලිසිටර් ජනරාල් | 02 |
| 08 | අධ්‍යක්ෂ | 18 |
| 09 | කොමසාරිස් | 04 |
| 10 | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | 02 |
| 11 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති | 06 |
| 12 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 04 |
| 13 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 18 |
| 14 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ | 01 |
| 15 | ජාතික පාසැල් විදුහල්පති | 03 |
| 16 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 04 |
| 17 | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 01 |
| 18 | නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් | 01 |
| 19 | නියෝජ්‍ය රේගු අධිකාරී | 06 |
| 20 | නියෝජ්‍ය විගණකාධිපති | 02 |
| 21 | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 03 |
| 22 | නීති කෙටුම්පත් සම්පාදක | 02 |
| 23 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | 02 |
| 24 | ප්‍රාදේශීය ලේකම් | 64 |
| 25 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | 01 |
| 26 | පළාත් සර්වේයර් ජනරාල් | 02 |
| 27 | විශේෂඥ වෛද්‍ය නිලධාරී | 132 |
| 28 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තනතුරු වලට පත්කිරීම් | 22 |
| 29 | ශ්‍රී ලංකා කෘෂි කාර්මික සේවයේ තනතුරු වලට පත්කිරීම් | 14 |
| 30 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ තනතුරු වලට පත්කිරීම් | 03 |
| 31 | සමථ මණ්ඩල ලේකම් | 01 |
| 32 | සහකාර විගණකාධිපති | 13 |
| 33 | හෙද විදුහල්පති | 07 |
|  | **එකතුව** | **412** |

**වගුව අංක17**

**5.4 විනය අංශය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව 2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරන අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හා 2016.10.27 දිනැති අංක 1990/24, 1990/25 හා

2017.02.01 දිනැති අංක 2004/49 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන් හැර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1955/22 හා 2016.02.25 දිනෙන් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන් ගේ විනය කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

විනය අංශය වෙත ලැබෙන සියලුම ලිපි ලේඛන පිළිබඳව සවිස්තරාත්මකව කරුණු අධ්‍යයනය කර අපක්ෂපාතී තීරණ ගැනීම සඳහා නිරවුල්ව, එම කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය සහයෝගය ලබා දෙයි.

### 5.4.1 විනය අංශයෙහි කාර්යභාරය

5.4 ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීම.

### (1) විනය කටයුත්තක් සම්බන්ධයෙන්

I. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් මගින් සිදු කරන ලද මූලික විමර්ශන වාර්තාවක් විනය අංශයට ලැබීමෙන් අනතුරුව එය පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කොට අදාළ තොරතුරු, ලිපිලේඛන, නිරීක්ෂණ හා නිර්දේශ සම්පූර්ණ කරගැනීමෙන් පසුව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සුදුසු තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

II. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කළහොත් එම චෝදනා පත්‍රය අදාළ නිලධාරියාට පරිපාලන බලධරයා හා අමාත්‍යංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් භාර දීමට කටයුතු කරනු ලබන අතර එම චෝදනා පත්‍රයට චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුර සහ ඒ සම්බන්ධව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යංශ ලේකම්ගේ හා පරිපාලන බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ තීරණයක් ගනු ඇත.

III. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළහොත් ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයෙන් සුදුසු නිලධාරියෙකු පරීක්ෂණ නිලධාරී ලෙස පත්කර එම විධිමත් විනය පරීක්ෂණය සිදු කරන ලෙස නියම කරනු ලැබේ. යම් හෙයකින් විධිමත් විනය පරීක්ෂණයක් නොපැවැත්වීමට තීරණය කළහොත් චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුර හා ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අදාළ අමාත්‍යංශ ලේකම්ගේ හා පරිපාලන බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කර ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනා වලින් නිදහස් කිරීම හෝ සුදුසු විනය දඬුවමක් පැනවීම හෝ සිදු කරනු ලබයි.

IV. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වුණි නම් එම පරීක්ෂණයේ වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබුණ පසු එම විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සියලුම වාචික හා ලිඛිත සාක්ෂි ද පරීක්ෂණ නිලධාරිගේ , පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරිගේ සහ රැකවරණ

නිලධාරිගේ වාර්තාවන් ද සැලකිල්ලට ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ චෝදනා එකකට, කිහිපයකට හෝ සියල්ලටම වරදකරු කොට සුදුසු විනය නියෝගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබේ.

V. තවද විනය ක්‍රියාපටිපාටියේ කොටසක් වශයෙන් කිසියම් චූදිත නිලධාරියෙක් වැඩ තහනමට ලක් කිරීම හෝ එවැනි වැඩ තහනමේ පසුවන නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීම හෝ අනිවාර්ය නිවාඩු මත තැබීම හෝ නොනිමි විනය කරුණු පවතිද්දී අදාළ නිලධාරියා විශ්‍රාම ගන්වන්නේ නම් එකී විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් කිරීම හෝ සිදු කරනු ලැබේ.

### (02) අධ්‍යාපන සේවා කමිටුව විසින් සහ සෞඛ්‍ය සේවා කමිටුව විසින් ලබා දෙන විනය නියෝගවලට අදාළව කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව 2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරන අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ට අධ්‍යාපන සේවා කමිටුව විසින් සහ 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 හා සහ 2017.02.01 දිනැති අංක 2004/49 දරන අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ට සෞඛ්‍ය සේවා කමිටුව විසින් පනවනු ලබන විනය නියෝගයන්ට එරෙහිව එම නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු ද එම අභියාචනා සම්බන්ධයෙන් අදාළ කමිටුව විසින් සහ එම නිලධාරීන්ගේ පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් වෙත සහන සැලසීම/අභියාචනා ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ.

### (03) සේවය හැරයාමේ නිවේදනවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන්

2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරන අති විශෙෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හා 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 හා සහ 2017.02.01 දිනැති අංක 2004/49 දරන අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හැර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1955/22 හා 2016.02.25 දිනෙන් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන්ගේ සේවය හැරයාමේ නිවේදනවලට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු සහ එම අභියාචනා සම්බන්ධයෙන් එම නිලධාරීන්ගේ පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් සුදුසු පරිදි නැවත සේවයේ පිහිටුවීම/නොපිහිටුවීම සිදු කරනු ලැබේ.


**(04) උපරිමාධිකරණ, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය, මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන්**

කොමිෂන් සභාව විසින් පනවනු ලබන විනය නියෝගවලට හෝ එවැනි විනය කටයුතු පිළිබඳ තීරණයන්ට එරෙහිව උපරිමාධිකරණයට ගොනු කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව වෙත සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම හා අභියාචනා කැඳවනු ලබන දිනවලදී එම ආයතනයන්හි පෙනී සිටීම ද මානව හිමිකම් කොමිසම විසින් කරනු ලබන විමසීම් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කිරීම ද කරනු ලැබේ.

**5.4.2 විනය අංශයේ ප්‍රගතිය - (2016.01.01 – 2016.12.31)**

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | චෝදනා පත්‍ර නිකුත් කිරීම | 91 |
| 02 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 20 |
| 03 | චෝදනාවලින් නිදහස් කිරීම | 57 |
| 04 | සේවයෙන් පහ කිරීම | 03 |
| 05 | අනෙකුත් විනය දඬුවම් | 63 |
| 06 | නැවත සේවයේ පිහිටුවීම | 27 |
| 07 | අභියාචනා ප්‍රතික්ෂේප කිරීම | 17 |
| 08 | වි.වැ.ව්‍ය.සං.12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 14 |
| 09 | අනිවාර්ය නිවාඩු ගැන්වීම | 06 |
| 10 | අනිවාර්ය විශ්‍රාම ගැන්වීම් | 01 |
| 11 | වැඩ තහනම් කිරීම | 10 |
| 12 | විනය පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම | 114 |
| 13 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම | 14 |
| 14 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම් | 06 |
| 15 | විනය කටයුතු අවසන් කිරීම් | 60 |
| 16 | අනිකුත් සාමාන්‍ය නියෝග | 342 |
| 17 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ අභියාචනා සඳහා නිරීක්ෂණ | 58 |
| 18 | අධිකරණ අයදුම්පත් සඳහා නිරීක්ෂණ | 10 |
| | **එකතුව** | **913** |

**වගුව අංක 18**




**රූපසටහන අංක 04**

2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා කටයුතු කරමින් පැවති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු, අභියාචනාධිකරණ නඩු හා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර අභියාචනා ප්‍රමාණය පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | - 37 |
| අභියාචනාධිකරණ අයදුම්පත් | - 24 |
| පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර අභියාචනා | - 148 |

### 5.5 අභියාචනා අංශය

බලය අභිනියෝජිත බලධරයකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරීන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහාත්, එම අභියාචනා සම්බන්ධයෙන් නියමිත කාල රාමුව තුළදී තීරණ ලබා දීම සඳහාත් කොමිෂන් සභාවට සහය ලබා දීම අභියාචනා අංශය මගින් සිදු කරයි.

#### 5.5.1 අභියාචනා අංශයේ කාර්යභාරය

i. එක් එක් අභියාචනය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා කැඳවීම.

ii. ඉන් පසුව එක් එක් අභියාචනය සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

iii. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණ අභියාචක වෙත හා අනෙකුත් අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීම.

iv. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණවලට එරෙහිව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා නිරීක්ෂණ වාර්තා සකස් කිරීම සහ එම අභියාචනා විභාගයට ගන්නා අවස්ථාවේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම අධිකාරය ඉදිරියේ පෙනී සිටීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

vi. මහජන පෙත්සම් කාරක සභාව විසින් විභාගයට ගනු ලබන පෙත්සම් සම්බන්ධයෙන් එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටීම.

vii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තිරණවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ/නිර්දේශ ඉදිරිපත් කිරීම.

viii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලබන පෙත්සම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.


ix. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අයදුම්පත්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

x. ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.

### 5.5.2 අභියාචනා අංශයේ ප්‍රගතිය (2016.01.01 – 2016.12.31)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වර්ෂය තුළ ලැබුණු අභියාචනා | 1377 |
| 02 | වාර්තා ලැබී නොමැති අභියාචනා | 419 |
| 03 | වාර්තා ලැබී කටයුතු කරමින් පවතින අභියාචනා | 299 |
| 04 | වර්ෂය තුළ කටයුතු නිම කළ අභියාචනා ගණන | 1480 |
| 05 | දැනට පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 29 |
| 06 | දැනට පවතින අභියාචනාධිකරණ නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 03 |
| 07 | දැනට පවතින පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරී නඩු ගණන (පෙර වර්ෂයන්ද ඇතුළත්ව) | 204 |
| 08 | මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් ගණන | 10 |

**වගු අංක 19**




**රූපසටහන අංක 05**

## 5. 6 අධ්‍යාපන සේවා කමිටුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම අනුව අධ්‍යාපන සේවා කමිටුව පිහිටුවීම සඳහා අංක 1989/29 හා 2016.10.19 දිනැති ගැසට් පත්‍රයෙහි පළකර ඇත. එහි "ආ" උපලේඛනයේ බලතල පැවරීමට අදාළ විධිවිධාන 2016.10.20 දින සිට බල පැවැත්වෙන පරිදි අංක 1992 හා 2016.11.07 දිනැති සංශෝධන ගැසට් පත්‍රය පළකර ඇති අතර ඒ අනුව අධ්‍යාපන සේවා කමිටුව විසින් අදාළ කාර්යයන් ඉටු කරනු ලැබේ.

### 5.6.1 අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යභාරය

අංක 1989/29 හා 2016.10.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සහ අංක 1992/07 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ (සංශෝධනය) පළ කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනීම් පටිපාටි/උසස් කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම්,සේවයේ ස්ථිර කිරිම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩ බැලිමේ/ රාජකාරි ඉටු කිරිමේ පදනම මත පත් කිරිම,මුදා හැරීම (ස්ථිර/තාවකාලික), සේවයෙන් ඉල්ලා අස්වීම,සේවය හැරයාමේ නිවේදන වලට එරෙහි අභියාචනා පිළිබඳව සලකා බැලීම,

සේවයට/තනතුරට නැවත පත් කිරීම,විශ්‍රාම ගැන්වීම හා විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම පිළිබඳ කටයුතු අධ්‍යාපන සේවා කමිටුවේ කාර්ය භාරයට ඇතුළත් වේ..

එමෙන්ම, අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනිම් පටිපාටි/උසස් කිරීම් පටිපාටි අනුව උසස් කිරීම (ශ්‍රේණියෙන් ශ්‍රේණියට/ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත) සිදු කරනු ලැබේ.


තවද, කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම සිදු කරන අතර අධ්‍යාපන සේවා කමිටුවේ විෂය පථයට අයත් නිලධාරීන්ට අදාළව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උප ලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම අධ්‍යාපන සේවා කමිටුව මගින් සිදු කෙරේ.

එසේම, අංක PSC/EST/02 – 03/05/2016 හා 2016.12.09 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය දැනුම් දිම අනුව දේශපාලන පළිගැනීම් සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමද අධ්‍යාපන සේවා කමිටුව මගින් සිදු කරනු ලැබේ.

**5.6.2 අධ්‍යාපන සේවා කමිටුවේ ප්‍රගතිය ( 2016.10.01 – 2016.12.31 )**

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | චෝදනාපත්‍ර නිකුත් කිරීම | 03 |
| 02 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 03 |
| 03 | චෝදනා වලින් නිදහස් කිරීම | 02 |
| 04 | අනෙකුත් දඬුවම් නියෝග | 01 |
| 05 | වි.වැ.ව්‍ය.සංග්‍රහයේ 12 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 02 |
| 06 | අනිවාර්ය නිවාඩු ගැන්වීම | 01 |
| 07 | විනය පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම | 08 |
| 08 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම | 02 |
| 09 | අනෙකුත් සාමාන්‍ය නියෝග | 13 |
| 10 | විශ්‍රාම ගැන්වීම | 23 |
| 11 | ස්ථිර කිරීම | 01 |
| 12 | බඳවා ගැනීම | 330 |
| 13 | කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම | 29 |
| 14 | වැඩ බැලීමට පත් කිරීම | 01 |
| 15 | ස්ථිරව මුදා හැරීම | 07 |
| 16 | තනතුරු වලට පත් කිරීම | 02 |
| 17 | වෙනත් කරුණු | 01 |
| | එකතුව | 429 |

**වගුව අංක 20**




**රූප සටහන අංක 06**

## 5.7 සෞඛ්‍ය සේවා කමිටුව

අංක 1990/24 දරන 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2016 නොවැම්බර් මස පළමුවැනි දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය සේවා කමිටුව වෙත බලතල පවරන ලද අතර අංක 1990/25 දරන 2016.10.27 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2016.10.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම කමිටුව සඳහා සාමාජිකයන් පත්කර ඇත.


### 5.7.1 සෞඛ්‍ය සේවා කමිටුවේ කාර්යභාරය

අංක 1990/24 දරන 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ "ආ" ,උපලේඛනය මගින් පැවරී ඇති බලතල අනුව කමිටුව වෙත ඉදිරිපත් කරන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම මෙම කමිටුවේ කාර්යභාරය වේ.

## 5.7.2 සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය ( 2016.10.01 – 2016.12.31 )

| අනු අංකය | කාරණය | සංඛ්‍යව |
|---|---|---|
| 01 | චෝදනාපත්‍ර නිකුත් කිරීම | 02 |
| 02 | චෝදනා වලින් නිදහස් කිරීම | 02 |
| 03 | සේවයෙන් පහකිරීම | 03 |
| 04 | නැවත සේවයේ පිහිටුවීම | 02 |
| 05 | විනය පරීක්ෂණ නිලධාරින් පත් කිරීම | 01 |
| 06 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම | 02 |
| 07 | අනෙකුත් සාමාන්‍ය නියෝග | 06 |
| 08 | වර්ෂය තුළ ලැබුණු අභියාචනා ගණන | 23 |
| 09 | වාර්තා ලැබී නොමැති අභියාචනා ගණන | 22 |
| 10 | වාර්තා ලැබී කටයුතු කෙරෙමින් පවතින අභියාචනා ගණන | 02 |
| 11 | කටයුතු නිමකළ අභියාචනා ගණන | 02 |
| 12 | වර්ෂය තුළ ලැබුණු වෙනත් ඉල්ලීම් ගණන | 719 |
| 13 | විශ්‍රාම ගැන්වීම් | 32 |
| 14 | ස්ථිර කිරීම් | 15 |
| 15 | බඳවා ගැනීම් | 59 |
| 16 | උසස් කිරීම් | 130 |
| 17 | කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම් | 06 |
| 18 | ස්ථිරව මුදා හැරීම් | 01 |
| 19 | සේවා දීර්ඝ කිරීම් | 29 |
| 20 | තනතුරු වලට පත්කිරීම් | 13 |
| | **එකතුව** | **1071** |

**වගුව අංක 21**




**රූප සටහන අංක 07**

## 5.8 පාලන අංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු පාලන අංශය වෙත පැවරී ඇත. අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) මෙම අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

පාලන අංශය පහත සඳහන් කාර්යභාරය මෙහෙයවනු ලබයි

- කොමිෂන් සභා කාර්යාලයේ සමස්ත පරිපාලනය
- කොමිෂන් සභා කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණය
- තොරතුරු කළමනාකරණ කටයුතු

### 5.9 මූල්‍ය අංශය

මෙම අංශය කොමිෂන් සභා කාර්යාලය සඳහා නිර්බාධ මූල්‍ය තොරතුරු ප්‍රවාහයක් සහ කළමනාකරණ පද්ධතියක් සහතික වෙමින් මූල්‍යමය සේවා සපයයි. ඒ සඳහා පහත ක්‍රියාකාරකම් සපුරාලනු ලැබේ.

- කොමිෂන් සභා කාර්යාලය සඳහා මූල්‍ය සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ හා සේවා සැපයීම
- ස්ථාවර වත්කම් කළමනාකරණය
- මූල්‍යමය කරුණු සම්බන්ධව මාර්ගෝපදේශනය සහ උපදේශනය
- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වන ලේකම්වරයාට මූල්‍ය අංශයේ කටයුතු පිළිබඳව යාවත්කාලීන තොරතුරු සැපයීම
- අංශ අතර මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය
- ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම

### 5.10. අභ්‍යන්තර විගණන අංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ සෘජු අධීක්ෂණය යටතේ ස්ථාපිත කර ඇති මෙම අංශය මගින් 2016 වර්ෂය තුළ පහත දැක්වෙන කාර්යභාරය ඉටු කර ඇත.

ආයතන තුළ ඵලදායී කාර්ය සාධනයක් හා සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රමයක් තහවුරු කිරීම පිණිස,

- මූල්‍ය විගණනය
- පද්ධති විශ්ලේෂණය හා කාර්ය සාධන විශ්ලේෂණය කෙරෙහි අවධානය යොමු කරමින් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කිරීමත් ඒ අනුව ආයතනයේ සියළුම අංශ ආවරණය වනසේ අඛණ්ඩව වසර පුරා අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරීම
- අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම
- විගණන කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීම හා පැවැත්වීම මගින් කළමනාකරණ තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් තොරතුරු ඉදිරිපත් කිරීම මගින් ඉහළ කළමනාකරණයට අවශ්‍ය සහයෝගය ලබා දීම

## 6. මුදල් ප්‍රතිපාදනය

2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ වියදම් සාරාංශය පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| පුනරාවර්තන | 159,002,000.00 | 157,006,696.66 | 1,995,303.34 |
| ප්‍රාග්ධන | 185,150,000.00 | 126,472,145.62 | 58,677,854.38 |
| එකතුව | 344,152,000.00 | 283,478,842.28 | 60,673,157.72 |

**වගුව අංක 22**

## 7. කාර්ය මණ්ඩලය

### 7.1 සංවිධාන සටහන

සංවිධාන සටහන සඳහා ඇමුණුම 03 බලන්න.

### 7.2 කාර්ය මණ්ඩල සංයුතිය

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 193 කින් සමන්විත වූ අතර එම කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සත්‍ය වශයෙන්ම සේවයේ යොදවන ලද කාර්ය මණ්ඩලය 146 ක් විය. එහි කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**කාර්ය මණ්ඩල විස්තර**

| තනතුර | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ලේකම් | 01 |
| අතිරේක ලේකම් | 02 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 05 |
| සහකාර ලේකම් | 25 |
| ගණකාධිකාරී | 02 |
| පරිපාලන නිලධාරී | 02 |
| භාෂා පරිවර්තක | 03 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 75 |
| රියදුරු | 12 |
| කාර්යාල සේවක | 17 |
| **එකතුව** | **146** |

**වගුව අංක 23**

### 7.3 කාර්ය මණ්ඩල පුහුණු කටයුතු

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ විෂය දැනුම,භාෂා ප්‍රවීනතාවය, තාක්ෂණික දැනුම හා විශේෂ කළමනාකරණ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් වලට සහභාගී වීමේ අවස්ථාව 2016 වර්ෂය තුළද ආයතනය මගින් ලබා දීමට කටයුතු කර ඇත.

| ශ්‍රේණිය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | 06 |

**වගුව අංක 24**

### 8. 2016 වර්ෂය තුළ එක් එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන

| අංශය | ශ්‍රේෂ්ඨාධිකරණය | අභියාචනාධිකරණය | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය |
|---|---|---|---|
| ආයතන | 67 | 12 | 27 |
| පත්කිරීම් | 35 | 12 | 129 |
| උසස්කිරීම් | 36 | 04 | 86 |
| විනය | 37 | 24 | 148 |
| අභියාචනා | 36 | 03 | 260 |
| **එකතුව** | **211** | **55** | **650** |

**වගුව අංක 25**

### 9. කොමිෂන් සභා රැස්වීම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කොමිෂන් සභා රැස්වීම් 108 ක් පවත්වා ඇත.

## 10. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු රැස්වීම්

| අනු අංකය | දිනය | කාරණය | සහභාගී වූ දෙපාර්තමේන්තු / අමාත්‍යංශ/ආයතන |
|---|---|---|---|
| 01 | 2016.03.02 | ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයේ තනතුරු පුරප්පාඩු පිරවීම | කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යංශය/බුද්ධිමය දේපල කාර්යාලය |
| 02 | 2016.05.05 | වනජීවී දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත අඩවි ආරක්ෂක නිලධාරීන් යෙදවීම පිළිබඳ සාකච්ඡා කිරීම | තිරසාර සංවර්ධන හා වන ජීවී අමාත්‍යංශය/වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය |
| 03 | 2016.06.29 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී හා ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්ගේ ගැටලු සම්බන්ධව සාකච්ඡා කිරීම | අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය |
| 04 | 2016.08.26 | තැපැල් දෙපාර්තමේන්තුවේ ගැටලු පිළිබඳ සාකච්ඡාව | තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යංශය /තැපැල් දෙපාර්තමේන්තුව |
| 05 | 2016.10.06 | දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළව පැන නැගී ඇති ගැටලු වලට විසඳුම් සෙවීම සඳහා පොදු ක්‍රම වේදයක් සකස් කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය/මුදල් අමාත්‍යංශය |
| 06 | 2016.10.09 | 11/11ශ්‍රේණියේ කාලගුණ විද්‍යා තනතුරු පිරවීම | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |
| 07 | 2016.10.10 | දීප ව්‍යාප්ත සේවා පිළිබඳ පැන නැගී ඇති ගැටලු වලට විසඳුම් සෙවීම සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කිරීම | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව/රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය/මුදල් අමාත්‍යංශය |
| 08 | 2016.10.10 | නව සේවා ව්‍යවස්ථාව අනුව නියෝජ්‍ය කොමසාරිස් තනතුරට ජ්‍යෙෂ්ඨත්වය, කුසලතාවය මත පත් කිරීම | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 09 | 2016.10.10 | දීප ව්‍යාප්ත සේවා පිළිබඳ පැන නැගී ඇති ගැටලු වලට විසඳුම් සෙවීම සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 10 | 2016.10.11 | දේශීය ආදායම් සේවා ව්‍යවස්ථාවේ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම | මුදල් අමාත්‍යංශය/ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 11 | 2016.10.12 | නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩු පිරවීම | ශ්‍රී ලංකා රේගුව |
| 12 | 2016.10.20 | සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීමට | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ |

| | | | |
|---|---|---|---|
| | | මනාපය පළ කරන ලද නිලධාරීන් එම මනාපය ඉල්ලා අස්කර ගැනීමට ඉල්ලුම් කිරීම | අමාත්‍යාංශය |
| 13 | 2016.10.20 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ උපකරණ අධිකාරී තනතුර | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 14 | 2016.11.01 | ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනඥවරුන් හා ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරුන් ගේ උසස් වීම් සම්බන්ධ ගැටලුව | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය/ජන ලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව |
| 15 | 2016.11.01 | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ හා සංඛ්‍යාලේඛනඥ ජ්‍යෙෂ්ඨතාවය පිලිබඳ ඇතිවී ඇති ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය/ජන ලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව |
| 16 | 2016.11.02 | දේශීය අදායම් සේවා ව්‍යවස්ථාවේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 17 | 2016.11.02 | වනජීවී දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු පිරවීම පිළිබඳ සාකච්ඡා කිරීම | තිරසාර සංවර්ධන හා වන ජීවී අමාත්‍යංශය/වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 18 | 2016.11.02 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් නිලධාරීන්ගේ උසස් වීම් සම්බන්ධව | කෘෂිකර්ම අමාත්‍යාංශය/ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 19 | 2016.11.02 | ශ්‍රී ලංකා විදේශ සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීම පිළිබඳ සාකච්ඡාව | විදේශ කටයුතු අමාත්‍යංශය |
| 20 | 2016.11.02 | SCFR 283/2014 නඩුව සමථයකට පත් කර ගැනීම සඳහා සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 21 | 2016.11.02 | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ හා අනෙකුත් උසස්වීම් සම්බන්ධව | කෘෂිකර්ම අමාත්‍යාංශය/ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 22 | 2016.11.02 | නව සේවා ව්‍යවස්ථාව අනුව අයදුම්පත් කැඳවීමේ නිවේදනය සැකසීම | විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 23 | 2016.11.09 | දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ගැටලු | දුම්රිය දෙපාර්තමේන්තුව |
| 24 | 2016.11.10 | අධ්‍යාපන සේවා කමිටුව පිහිටවූ පසු ඉදිරි කටයුතු සිදු කළ යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීම හා වර්තමාන ප්‍රගතිය විමසීම | අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 25 | 2016.11.10 | • ජාතික පාසල්වල ආවරණ අනුමැතියට යටත්ව තාවකාලිකව අනුයුක්ත කර ඇති විදුහල්පතිවරුන් සම්බන්ධයෙන්.<br>• ජාතික පාසල් විදුහල්පතිවරු පත්කිරීම සම්බන්ධයෙන් .<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය III - බඳවා ගැනීම.<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව බඳවා ගැනීම් සඳහා වාචික පරීක්ෂණයක් පැවැත්වීම.<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය - අන්තර්ග්‍රහණය කිරීම.<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 පන්තිය - උසස්වීම්.<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය - උසස්වීම්.<br>• කාර්යයේ නියුතු අධ්‍යාපන අධ්‍යක්ෂවරු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ අධි සේවක පදනම මත පත් කිරීම.<br>• ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථානමාරුවීම්.<br>• ශ්‍රී ලංකා විදුහල්පති සේවය - අන්තර්ග්‍රහණය<br>• ශ්‍රී ලංකා ගුරු අධ්‍යපනඥ සේවය - අන්තර්ග්‍රහණය කිරීම.-<br>• ශ්‍රී ලංකා ගුරු අධ්‍යපනඥ සේවය - උසස්වීම්.<br>• ජාතික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ සේවය ස්ථිර කිරීම, උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු ක්‍රියා කිරීම.<br>• ගුරු සේවයේ අන්තර්ග්‍රහණය කිරීම්.<br>• ජාතික පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීම.<br>• සියළු කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.<br>• දේශපාලන පළිගැනීම් සම්මුඛ පරීක්ෂණ කටයුතු. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 26 | 2016.11.11 | සෞඛ්‍ය සේවා කමිටුව පිළිබඳ දැනුවත් කිරීම | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 27 | 2016.11.15 | ශ්‍රී ලංකා සැලසුම් සේවය සම්බන්ධ කරුණු | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 28 | 2016.11.16 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු ගණනය | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 29 | 2016.11.18 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ පවත්නා ගැටලු සම්බන්ධ සාකච්ඡාව | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 30 | 2016.11.18 | වෛද්‍ය සේවයේ ගැටලු සාකච්ඡා කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සේවා අංශයේ නිලධාරීන් |
| 31 | 2016.11.22 | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය |
| 32 | 2016.11.28 | බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය කිරීම සම්බන්ධ ගැටලු | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය |
| 33 | 2016.12.05 | හෝමියෝපති රෝහලේ බඳවා ගැනීම් පරිපාටිය සම්බන්ධ ගැටලු | ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 34 | 2016.12.07 | හෙද ගැටලු | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 35 | 2016.12.15 | • ජාතික පාසල්වල ආවරණ අනුමැතියට යටත්ව තාවකාලිකව අනුයුක්ත කර ඇති විදුහල්පතිවරුන් සම්බන්ධයෙන්.<br>• ජාතික පාසල් විදුහල්පතිවරු පත්කිරීම සම්බන්ධයෙන් .<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය III - බඳවා ගැනීම.<br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය - උසස්වීම්.<br>• ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථාන මාරුවීම්. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 36 | 2016.12.19 | දේශීය ආදායම් සේවා ව්‍යවස්ථාවේ 19.3 වගන්තිය සංශෝධනය කිරීම | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 37 | 2016.12.19 | දේශීය ආදායම් සේවයේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස් කර ඉදිරිපත් කිරීම හා උසස් කිරීම | මුදල් අමාත්‍යාංශය |
| 38 | 2016.12.20 | කාර්මික අධ්‍යාපන සේවයේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| 39 | 2016.12.21 | ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් කරුණු | ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 40 | 2016.12.27 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සුදුසුකම් සංශෝධනය | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 41 | 2016.12.28 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නිෂ්පාදක (දෙපාර්තමේන්තුගත) තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 42 | 2016.12.29 | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුර | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |

**වගුව අංක 26**

## 11. ස්තුතිය

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද බොහෝ සුවිශේෂ කටයුතු වලදී සියලුම අමාත්‍යංශ ලේකම්වරුන්ද, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ද, විශේෂයෙන් ,

- ජනාධිපති ලේකම් කාර්යාලය
- අග්‍රාමාත්‍ය කාර්යාලය
- අමාත්‍ය මණ්ඩල කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය
- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
- තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය
- නීතිපති දෙපාර්තමේන්තුව හා
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය ද

දක්වනු ලැබූ අනුබලය හා දායකත්වය වෙනුවෙන් කොමිෂන් සභාවේ කෘතවේදීත්වය මෙහිලා විශේෂයෙන් සනිටුහන් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| ධ. දිසානායක මහතා | සභාපති | |
| විනිසුරු ඒ.ඩබ්ලිව්.ඒ. සලාම් මහතා | සාමාජික | |
| කාන්ති විජේතුංග මහත්මිය | සාමාජික | |
| ආචාර්ය පී රාමනුජම් මහතා | සාමාජික | |
| වී ජෙගරාසසිංගම් මහත්මිය | සාමාජික | |
| එස් එන් සෙනෙවිරත්න මහතා | සාමාජික | |
| එස් රණුග්ගේ මහතා | සාමාජික | |
| ඩී එල් මෙන්ඩිස් මහතා | සාමාජික | |
| එස් ඒ සී එස් ඩබ්ලිව් ජයතිලක මහතා | සාමාජික | |

ඇමුණුම 01

**සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනා**

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි**

| 2016.01.01 දිනට නිම නොවී තිබූ පැමිණිලි සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 2016.12.31 දිනට ලැබී තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළපැමිණිලි සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ පැමිණිලිසංඛ්‍යාව | 2016.12.31 දිනට නිම නොවූ පැමිණිලිසංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **274** | **75** | **349** | **69** | **13** | **267** |

**ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2016.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2016.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කළ සංඛ්‍යාව | 2016.12.31 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **90** | **26** | **116** | **40** | **02** | **74** |

**අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2016.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2016.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2016.12.31 දිනට නිම නොවූ අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **34** | **08** | 42 | **14** | -- | 28 |

- ඉහත අභියාචනා වලට අමතරව 2016.01.01 – 2016.12.31 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත පැමිණිලි 06 ක් යොමුකර තිබුණි.
- 2016.01.01 – 2016.12.31 කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි සංඛ්‍යාව 30 ක් වන අතර එම පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා යවා ඇත.
- 2016.01.01 – 2016.12.31 කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි 10 ක් සඳහා කටයුතු කර ඇත.

ඇමුණුම 02

**සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නොවන නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනා**

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි**

| 2016.01.01 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු සංඛ්‍යාව | 2016.12.31 දිනට ලැබී තිබූ මුළු සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළ සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ සංඛ්‍යාව | 2016.12.31 දිනට නිම නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **199** | **75** | **274** | **43** | **11** | **220** |

**ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**


| 2016.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2016.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කළ සංඛ්‍යාව | 2016.12.31 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 19 | 09 | 28 | -- | 01 | 27 |

**අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු**

| 2016.01.01 දිනට නිම නොවී තිබූ නඩු සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු නඩු සංඛ්‍යාව | 2016.12.31 දින වන විට ලැබුණු මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2016.12.31 දිනට නිම නොවූ අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | 01 | 02 | --- | --- | 02 |

- 2016.01.01 - 2016.12.31 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත නඩු ඉදිරිපත් කර නැත.
- සමාලෝචිත කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කර නැත.
- 2016.01.01 - 2016.12.31 කාලය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වූ පැමිණිලි සංඛ්‍යාව 10 කි.

## සංවිධාන සටහන ඇමුණුම 03
## රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය




අති.ලේ - අතිරේක ලේකම්
ජ්‍යේ.ස.ලේ. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ස.ලේ - සහකාර ලේකම්